

# කඩවර යාගය
## අපූරු නිර්මාණයකි

ජගත් ජේ එදිරිසිංහ

අපේ ජනශ්‍රැතියේ එන කතා අතරින් වඩාත් ප්‍රභල කතාවක් ලෙස කඩවර දෙවියන් පිළිබඳව වන පුරාවෘත්තය සැළකිය හැකිය. මේ වෘත්තාන්තයට පාදක වන සිදුවීම් සමූහයේ ඇති නාට්‍යෝචිත බව එය වේදිකා රංගනයක් ලෙස ඉදිරිපත් කරන්නට මහඟු පිටුවහලක් සපයයි. චලංක අතලගේ නිර්මාණකරුවා එය මැනැවින් වටහාගෙන ඇති බව පසුගියදා හැලම් රංග ශාලාවේදී අප රසවිී කඩවර යාගය රංගනය අපට පෙන්වා දෙයි.

කඩවර දෙවියන්ගේ කතාව රංග හතකට වෙන්කර අදාල නර්තනාංග නිර්මාණය කර වේදිකාව මත කරන ලද රංග කාර්යය අපූරුය.



මේ නිර්මාණයේදී පළමුව දර්ශණ රුවන් දිසානායක ගේ සංගීතයත් ආචාර්ය ලිහිරු සාරංග ගේ පිටපතත් කැපී පෙනෙයි. පාරම්පරික නාද රටා උපයෝගී කරගනිමින් නිර්මාණය කර තිබූ සංගීතයත් ගායනයත් කඩවර යාගය ඔසවා තබන්නට මහත් පිටුවහලක් විය. ඒ සංගීතයට නිර්මාණයකරන ලද නර්තනාංග වේදිකාව මත රඟ දැක්වීමේදී සියලූම ශිල්පීන් සහ ශිල්පිණියන් දැක් වූ දස්කම් අගය කළ යුතු ය.



පහතරට නර්තන සම්ප්‍රදාය අනුව යමින් නිර්මිත මේ මනබඳින නර්තන මනා ලෙස දරැ දැරියනට පුහුණු කරන්නට විසල් වෙහෙසක් ගන්නට ඇති බව පැහැදිළි ය.

කඩවර ලෙස රංනය ඉදිරිපත් කළ චලංක අතලගේත් මහ රජ ලෙස රංගනය ඉදිරිපත් කළ නන්දසිරි ද සිල්වා ත් අනෙකුත් චරිත හා සමවැදුණ ශිල්පීන් සහ ශිල්පිණියනුත් මේ වේදිකා රංගනයට මනා ආලෝකයක් ගෙනදුන් බව සටහන් කළ යුතු ය. එක් එක් අවස්ථා සඳහා නර්තන නිර්මාණය කිරීමේදී චලංක අතලගේ දැක්වූ නිපුණත්වය විශිෂ්ටය.

පසුතල වීඩියෝ නිර්මාණ කතාවේ ගලායාමට මහත් පුටුවහලක් සැපයූ අතර ඒවා නිර්මාණය කළ රුචිත් ගුණරත්න ට අපේ පැසසුම හිමිවෙයි. වේදිකා ආලෝකකරණය කළ සුපින් බණ්ඩාර ද සිය යුතුකම මැනැවින් ඉටු කර තිබුණි. නිර්මාණයේ දැවැන්ත බව රැකගැනීමට ඔවුන්ගෙන් ලද පිටුවහල අපමණය

වේදිකාවේ දිගහැරුණු සමහර ජවනිකා සම්බන්දයෙන් නිර්මාණකරුවාගේ අවධානය යොමු නොවූ තැන් කීපයක් පෙන්වා දෙනු කැමැත්තෙමි.

කාල දරුවාගේ සිරුර වේදිකාවට රැගෙන ඒම නොකළ යුතුව තිබුණ දෙයකැයි මම සිතමි. මළසිරුරක් වේදිකාවේ දර්ශනය වීම කෙතරම් උචිතද යන්න නැවත සිතා බැලිය යුතුය

එසේම කඩවර දේවාලයේ සේයාරැව අසළින් 60 දශකයේ යයි සඳහන් කිරීමේද නොගැළපීමක් දැනුණේ එම දශකයේ ඩිජිටල් මුද්‍රණයෙන් සකස් කළ දැන්වීම් පුවරු නොතිබුණ බව එක වර සිතට දැනෙන නිසා ය.

ලංකාවේ ප්‍රාදේශීය දෙවිවරුන් අතරින් ඉදිරියෙන්ම සිටින කඩවර දෙවියන් පිළිබ වෘත්තාන්තය රංගනයේ යෙදුණ සියලූම දරුවන් සහ දැරියන් දැන සිටි බව පෙනී යයි. එය ඉතා වැදගත් ය. තමන් මේ ඉදිරිපත් කරන වෘත්තාන්තයේ සුළ මුළ සොයා දැනගැනීමට ඒ දරු දිරියන්ට අවස්ථාව දීම පිළිබ ව නිර්මාණකරුවාට ස්තුතිවන්ත විය යුතු ය.

සමස්ථයක් ලෙස ගත් කළ කඩවර යාගය අපූර්වත්වයෙන් යුත් නිර්මාණයකි. මෙවන් දැවැන්ද නිර්මාණයක් එක් වතාවකින් අවසන් නොකර නැවත නැවතත් රංගගත කළ යුතු යයි අපට සිතෙයි.

හොඳ නිර්මාණයක් මෙල්බන් වේදිකාවට ගෙන ආ චලංක අතලගේ නිර්මාණකකරුවාටත් ඒ වෙනුවෙන් ශ්‍රමය කැප කළ දෙමාපියන්ටත් අපේ ස්තුතිය හිමිවෙයි.